# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report













## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
## கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்
## Department of Animal Production and Health

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2019


සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்

**Department of Animal Production and Health**

**Peradeniya**

**Sri Lanka**

**Tel : 94 - 081 – 2388337 / 2388462**

**Fax : 94 – 081 - 2388619**

**Web Site: www.daph.gov.lk**

# පටුන

පිටු අංකය


1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම 01

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 01

1.3. ප්‍රධාන කාර්යයන් 02

1.4. සංවිධාන සටහන 04

1.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 07

1.6. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ යටතේ පවතින ආයතන 07

1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 07

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය 08

2.2. 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ව්‍යාපෘති 15

3. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 18

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 19

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 20

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 21

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 22

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 23

3.7. මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 24

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 24

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව 24

4. කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 25

5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 25

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 26

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය/ අතිරික්තය බලපානු ලැබ බලපා ඇති ආකාරය 26

6.3. මානව සම්පත් සංවර්ධනය 27

7. අනුකූලතා වාර්තාව 32

8. ඇමුණුම I - විගණකාධිපතිවරයාගේ වාර්තාව

**2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**වැය ශීර්ෂ අංකය - 292**

## 1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැඳින්වීම

1978 වර්ෂයේදී ස්ථාපිත කරනු ලැබූ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනය වන අතර එය මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නගාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත්වේ. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් සභා පිහිටුවීමත් සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නවය (09) වෙතට පැවරිණි.

ජාතික සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණ නායකත්වය, විශේෂඥ සේවා සහ සහාය සේවා, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත ලබාදෙමින් පශු සම්පත් කර්මාන්තය වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි. පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 337 මගින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

### 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

#### 1.2.1. දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා පශු සම්පත් ක්ෂේත්‍රය මෙහෙයවන ප්‍රමුඛතම ආයතනය වීම.

#### 1.2.2. මෙහෙවර

නිරෝගිමත් සත්ත්ව ගහනයකින් හා ඉහළ නිෂ්පාදන ඵලදායිතාවයකින් යුක්තව ආහාර සුරක්ෂිතතාවයට දායකවීමෙන් හා ආහාරවල සෞඛ්‍යාරක්ෂිතභාවයද තහවුරු කරමින් පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් අත්පත්කර ගැනීම සඳහා තාක්ෂණික මගපෙන්වීම හා සහාය ලබාදීම.

1.2.3. අරමුණු

- සත්ත්ව රෝග වලක්වාලන සහ මර්දනය කරන කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම.
- සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රචලිත කිරීම.
- ගුණාත්මක සත්ත්ව ආහාර සහ ආහාර සම්පත් ප්‍රයෝජනයට ගැනීම ප්‍රචලිත කිරීම.
- සත්ත්ව ආහාර කර්මාන්තයේ වර්ධනය සහ සංවර්ධනය ප්‍රචලිත කිරීම.
- තිරසාර පශු සම්පත් සංවර්ධනයක් උදෙසා පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් පවත්වාගෙන යාම.
- තාක්ෂණිකව සවිබල ගැන්වූ මානව සම්පත් සංවර්ධනය.
- කාර්යක්ෂමව හා ඵලදායි ලෙස තොරතුරු බෙදාහැරීම සහ තාක්ෂණික සේවා සැපයීම තහවුරු කිරීම.
- ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ ඇගයීම.
- සත්ත්ව නිෂ්පාදනවල ආරක්ෂිතභාවය තහවුරු කිරීම.
- විධිමත් සත්ත්ව පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ ඊට අදාළව පහසුකම් සැපයීම.
- සතුන්ගේ සුභසාධනය සහ යහපැවැත්ම තහවුරු කිරීම.
- දෙපාර්තමේන්තු කාර්යයන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම .

1.3. ප්‍රධාන කාර්යයන්

- ඉහළ නිෂ්පාදන හැකියාවක් සහිත උසස් ආරයේ ගව හා එළු ශුක්‍ර නිෂ්පාදනය කිරීම ඇතුළු ජාතික කෘතිම සිංචන වැඩසටහන මෙහෙයවීම
- අභිජනන කටයුතු සඳහා සතුන්ගේ පෙළපත හා කාර්යසාධන වාර්තාකරණය
- සත්ත්ව ජාන සම්පත් ආරක්ෂණය
- එළුවන්ගේ ආරය නැංවීම
- වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- පෝෂ තෘණ හා සයිලේජ් නිෂ්පාදනය සහ තෘණ අලෙවිකරණය ප්‍රචලිත කිරීම
- රෝග වැලැක්වීමේ එන්නත්කරණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- දේශීයව එන්නත්සාර (කුර හා මුඛ, කාලගාත්‍රා, ගව රක්තාශ්‍රව, රානිකට්) සහ අනෙකුත් ජෛවීය ද්‍රව්‍ය නිෂ්පාදනය නිෂ්පාදනය කිරීම.
- බුරුළු ප්‍රදාහය වැලැක්වීම, සුව කිරීම සහ බුරුළු නික්ෂේපන නිෂ්පාදනය
- සැල්මොනෙල්ලෝසිස් හා රානිකට් රෝග පාලනය
- අති ව්‍යාධිජනක කුරුළු උණ රෝගයට එරෙහිව කාර්යක්ෂම පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ඇති කිරීම
- සත්ත්ව රෝග හඳුනාගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා පශු විමර්ශණ මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම
- කිරි ගොවිපොළවල සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීම
- පරික්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම සහ අවශ්‍යතාවයන් සැපිරීම

- කිරි ගොවිපොළවල සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීම
- පරික්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම සහ අවශ්‍යතාවයන් සැපිරීම
- කිරි තාක්ෂණ පරික්ෂණාගාර පහසුකම් හා යටිතල පහසුකම් ඉහළ නැංවීම
- පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා විශ්ලේෂණ සහ උපදේශන සේවා සැපයීම
- ක්ෂේත්‍ර මට්ටමේ සතුන් හඳුනාගැනීමේ කටයුතු සිදුකිරීම
- දේශීය වෙළෙඳපොළ තුළ උසස් තත්ත්වයේ සත්ව ආහාර සුලභ කිරීම තහවුරු කිරීම
- පශු නිෂ්පාදන හා ජෛවී ද්‍රව්‍ය නියාමනය
- කුකුළු පාලන ක්ෂේත්‍රයට අදාළ නියාමන කටයුතු
- සත්ත්ව නිරෝධායන හා ආවේක්ෂණ කටයුතු
- අන්තර්ජාතික වෙළඳාම් පහසුකරණය
- නිරෝධායන ඒකකවල යටිතල පහසුකම් ඉහළ නැංවීම සහ පරික්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම
- පශු සම්පත් පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පශු සම්පත් ඩිප්ලෝමාධාරීන් බිහිකිරීම සඳහා සත්ත්ව පාලන විද්‍යාල (කරඳගොල්ල/සීප්පුකුලම) පවත්වාගෙන යාම
- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ පුහුණු හා අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම
- ඉලෙක්ට්‍රොනික්, මුද්‍රිත මාධ්‍ය හා ප්‍රදර්ශන මගින් තොරතුරු බෙදාහැරීම
- ආදර්ශ ගොවිපොළ ඒකක ප්‍රදර්ශන
- පශු තාක්ෂණ උද්‍යානයේ විවිධ ගොවිපොළ ඒකක සංවර්ධනය හා නඩත්තු කිරීම
- පශු සම්පත් ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යයනයන් සිදුකිරීම
- පශු සම්පත් සංඛ්‍යාන ප්‍රකාශන සැකසීම හා බෙදාහැරීම
- පශු වෛද්‍ය සේවාව පුළුල් කිරීම සඳහා පශු වෛද්‍ය කාර්යාල ස්ථාපනය

## 1.4. සංවිධාන සටහන




**Other Staff :** BA , DO, DA, Le.Ass, Pro.Ass., Pro.Ass.Com, TO, Drftm, RA, PMA, LIB, LDO
Dri, Tra.Ope., LA, Mech, BO, Car, Elec, Ban.Kee, Watc, CatC, MM, GtC, AnC, Grs, O.E.S, Liv.Ass, GL, SL, FA

**DG** - අධ්‍යක්ෂ ජනරාල්
**ADG** - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
**D/AD** - අධ්‍යක්ෂ, පරිපාලන
**D/VRA** - අධ්‍යක්ෂ, පශු අණපනත් හා නීති
**D/LPE** - අධ්‍යක්ෂ, පශු සම්පත් සැලසුම් හා ආර්ථික
**D/HRD** - අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන
**D/AB** - අධ්‍යක්ෂ, සත්ත්ව අභිජනන
**D/VR** - අධ්‍යක්ෂ, පශු පර්යේෂණ
**D/AH** - අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය
**CA** - ප්‍රධාන ගණකාධිකාරී
**CLE** - ප්‍රධාන පශු ආර්ථික විශේෂඥ
**CE** - ප්‍රධාන වසංගතවේදී
**VPH.Sp.** - පශු මහජන සෞඛ්‍ය විශේෂඥ
**P.Sc** - ප්‍රධාන විද්‍යාඥ
**DE.Sp.** - කිරිගව ඉංජිනේරු විශේෂඥ
**Vet.In.Sp.** - පශු විමර්ෂණ විශේෂඥ
**C.Vac** - ප්‍රධාන එන්නත්වේදී
**R/AF** - ලේඛකාධිකාරි (සත්ත්ව ආහාර)
**R/VD** - ලේඛකාධිකාරි (පශු ඖෂධ)
**CAQO** - ප්‍රධාන සත්ත්ව නිරෝධායන නිලධාරී
**AB.Sp.** - සත්ත්ව අභිජනන විශේෂඥ
**VR.Sp.** - පශු ප්‍රජනන විශේෂඥ
**C.Agro.** - ප්‍රධාන ශෂ්‍යවේදී

**CIA** - ප්‍රධාන අභ්‍යන්තර විගණක
**Acct.** - ගණකාධිකාරි
**DD/AH** - නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය
**DD/VR** - නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු පර්යේෂණ
**DD/R** - නියෝජ්‍ය අධ්‍යක්ෂ, පර්යේෂණ
**DD/TS** - නියෝජ්‍ය අධ්‍යක්ෂ, තාක්ෂණ සේවය
**DD/LPE** - නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු සම්පත් සැලසුම් හා ආර්ථික
**DD/HRD** - නියෝජ්‍ය අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන
**DD/AB** - නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව අභිජනන
**DD/DD** - නියෝජ්‍ය අධ්‍යක්ෂ, කිරිගව සංවර්ධන
**LE** - පශු ආර්ථික විශේෂඥ
**AD.Ad** - සහකාර අධ්‍යක්ෂ/ පරිපාලන
**SVP** - එන්නත්සාර අධිකාරි
**AQO** - සත්ත්ව නිරෝධායන නිලධාරි
**VRO** - පශු පර්යේශණ නිලධාරි
**VIO** - පශු විමර්ශණ නිලධාරි
**VS** - පශු වෛද්‍ය නිලධාරි
**LO** - සත්ත්ව පාලන නිලධාරි
**RO** - පර්යේශණ නිලධාරි
**Leo** - නීති නිලධාරි
**Eng.** - සිවිල් ඉංජිනේරු
**AO** - පරිපාලන නිළධාරි

**RA/S** - පර්යේෂණ සහකාර /විශේෂ ශ්‍රේණිය
**LPO** - පශු සම්පත් ප්‍රවර්ධන නිලධාරි
**Trl** - භාෂා පරිවර්තක
**I & CTO** - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි
**SO** - සංඛ්‍යාලේඛණ නිලධාරි

අනෙකුත් කාර්ය මණ්ඩලය

**BA** - අයවැය සහකාර
**DO** - සංවර්ධන නිලධාරි
**DA** - සංවර්ධන සහකාර
**Le.Ass** - නීති සහකාර
**Pro.Ass.** - වැඩසටහන් සහකාර
**Pro.Ass.Com** - වැඩසටහන් සහකාර (සන්නිවේදන)
**TO** - තාක්ෂණ නිලධාරි
**Drftm** - සැලසුම් ශිල්පී
**RA** - පර්යේෂණ සහකාර
**PMA** - රාජ්‍ය කළමණාකරණ සහකාර
**LIB** - පුස්තකාලයාධිපති
**LDO** - පශු සම්පත් සංවර්ධන නිලධාරි
**Dri** - රියදුරු
**Tra.Ope.** - ට්‍රැක්ටර් ක්‍රියාකරු
**LA** - රසායනාගාර සහායක
**Mech** - යාන්ත්‍රික ශිල්පී

**BO** - බොයිලේරුකරු
**Car** - වඩුකරු
**Elec** - විදුලි ශිල්පී
**Ban.Kee.** - බංගලා භාරකරු
**Watc** - මුරකරු
**CatC** - පට්ටිගොනුන් රැකබලාගන්නා
**MM** - කිරිකරු
**GtC** - එළුවන් රැකබලාගන්නා
**AnC** - සත්ත්ව රැකවල්කරු
**Grs** - තණකොළ කපන්නා
**O.E.S.** - කාර්යාල කාර්යය සහයක
**Liv.Ass** - සත්ත්ව පාලන සහයක
**GL** - උද්‍යාන කම්කරු
**SL** - සනීපාරක්ෂක කම්කරු
**FA** - ක්ෂේත්‍ර සහායක

**1.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ**

- සත්ත්ව අභිජනන අංශය
- සත්ත්ව සෞඛ්‍ය අංශය
- පශු අණපනත් හා නීති අංශය
- පශු සම්පත් සැලසුම් හා ආර්ථික අංශය
- මානව සම්පත් සංවර්ධන අංශය
- පශු පර්යේෂණ අංශය
- මුදල් අංශය
- පරිපාලන අංශය

**1.6. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ යටතේ පවතින ආයතන**

- සත්ත්ව අභිජනන අංශය
  කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන (කුණ්ඩසාලේ, පොළොන්නරුව)
  එළු අභිජනන මධ්‍යස්ථාන (තෙලහැර, ඉඹුලන්දණ්ඩ)
- සත්ත්ව සෞඛ්‍ය අංශය
  පශු විමර්ශණ මධ්‍යස්ථාන (25)
- පශු අණපනත් හා නීති අංශය
  සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථාන (කොළඹ,කටුනායක,මත්තල, යාපනය)
- මානව සම්පත් සංවර්ධන අංශය
  සත්ත්ව පාලන විද්‍යාල (කරඳගොල්ල, සීප්පුකුලම)
  අඛණ්ඩ අධ්‍යාපන ආයතනය- ගන්නෝරුව
  පශු තාක්ෂණ උද්‍යානය- ගන්නෝරුව
- පශු පර්යේෂණ අංශය
  මධ්‍යම කුකුළු පර්යේෂණ මධ්‍යස්ථානය (කරඳගොල්ල)
  සත්ව විෂාණු රසායනාගාරය- පොල්ගොල්ල
  කිරි තාක්ෂණ රසායනාගාරය- ගන්නෝරුව

**1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු**

2019 වර්ෂය තුළදී විදේශාධාර ලබන ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක නොවීය.

## 2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2019 වර්ෂය තුළදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය (දෙසැම්බර් 31 දිනට)

| අනු අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය | 2019 අයවැය ප්‍රතිපාදන (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|
| 1. | සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන | 2.00 | 100 | 2.00 | |
| 2. | තත්ත්ව ආරක්ෂණ වැඩසටහන | 1.00 | 89 | 1.00 | |
| 3. | සතුන්ගේ බෝවන රෝග වැලැක්වීමේ වැඩසටහන | 43.00 | 95 | 38.70 | |
| 4. | පශු සම්පත් පර්යේෂණ වැඩසටහන | 30.00 | 91 | 25.98 | |
| 5. | සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය | 160.00 | 98 | 159.99 | |
| 6. | පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන | 4.70 | 85 | 4.70 | |
| 7. | වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ ව්‍යාපෘතිය | 50.00 | 94 | 47.75 | |
| 8. | පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම | 141.00 | 84 | 128.36 | |
| 9. | කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය | 13.50 | 78 | 11.27 | |
| 10. | සතුන් හඳුනාගැනීමේ වැඩසටහන | 14.00 | 58 | 13.15 | |
| 11. | සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය | 5.00 | - | 4.99 | 2018 වසරේ සිට 2019 වසරට අවිච්ඡේද වූ ක්‍රියාකාරකම් සිදුකර ඇත. |
| 12. | පොත් හා වාර ප්‍රකාශන | 0.30 | 100 | 0.30 | |
| 13. | සත්ත්ව රෝග ආවේක්ෂණය පුළුල් කිරීම | 20.00 | 100 | 20.00 | |
| 14. | කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම | 4.00 | 78 | 3.80 | |
| 15. | බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන | 5.00 | 96 | 4.75 | |
| 16. | උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම | 26.50 | 97 | 26.14 | |
| 17. | ජලභීතිකා රෝගය පාලනය කිරීමේ හා තුරන් කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහන | 132.00 | - | 132.00 | 2019.01.18 කැබිනට් ප්‍රකාශනයට අනුව මෙම ව්‍යාපෘතිය සෞඛ්‍ය අමාත්‍යංශය වෙතට පවරන ලදී |
| 18. | වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන | 47.00 | 75 | 17.59 | |
| 19. | පශු විමර්ෂණ මධ්‍යස්ථාන වල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම | 47.00 | 86 | 44.28 | |
| 20. | ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු සඳහා පහසුකරණය සඳහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම | 11.00 | 100 | 10.45 | |
| 21. | සත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම | 10.00 | 80 | 9.13 | |
| | එකතුව | **767.00** | | **706.33** | |

## 2.1. 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

### 2.1.1. පශු සම්පත් සංවර්ධනය

#### 2.1.1.1. කිරි ගව ක්ෂේත්‍රය

**අ. සතුන්ගේ ආරය වැඩිදියුණු කිරීම සහ සතුන් අභිජනනය**

රට තුළ කිරි නිෂ්පාදනය වැඩිකිරීම උදෙසා දේශීය එළ ගව සහ මී ගව ගහනය ගුණාත්මකව වැඩිකර ගැනීමට උසස් ආරයේ ගව ශුක්‍ර භාවිතා කර කෘත්‍රිම සිංචන කටයුතු ක්‍රියාත්මක කිරීම ප්‍රධාන සත්ත්ව අභිජනන වැඩසටහන වේ. ශුක්‍ර නිෂ්පාදනය කර බෙදාහැරීම, කෘත්‍රිම සිංචන ශිල්පීන් පුහුණු කිරීම, තෘණ හා පෝෂ තෘණ වර්ග හඳුන්වාදීම හා සංවර්ධනය සහ තෘණ වගාව පිළිබඳ පුහුණුව මෙම වැඩසටහනේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

| සමාලෝචිත කාල සීමාව තුළදී සත්ත්ව අභිජනන වැඩසටහනේ ප්‍රගතිය | |
|---|---|
| කුණ්ඩසාලේ සහ පොළොන්නරුවේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන මගින් නිෂ්පාදිත ශුක්‍ර වඩි ප්‍රමාණය | 337,834 |
| ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් සිදුකළ කෘත්‍රිම සිංචන සංඛ්‍යාව | 211,356 |
| කෘත්‍රිම සිංචනය කරන ලද එළදෙනුන් / වැස්සියන් සඳහා ගැබ් පරීක්ෂාවන් (ක්ෂේත්‍රයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින්) | 72,447 |
| වාර්තා වී ඇති පැටව් උපත් සංඛ්‍යාව | 66,157 |

**ආ. වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ වැඩසටහන**

කෘත්‍රිම සිංචනයේ සැබෑ ප්‍රතිලාභ අත්කර ගැනීමට මෙන්ම ජාතික කිරි නිෂ්පාදනය වැඩිකිරීමට කෘත්‍රිම සිංචන සේවය මගින් උපත ලැබූ වැස්සි පැටවුන් නියමිත පරිදි රැකබලා ගැනීම ගොවිපොළ මට්ටමේදී බලපාන ප්‍රධාන ගැටළුවයි. රට තුළ අභිජනනයට සුදුසු වැස්සියන්ගේ ගහනය වැඩිකිරීමටද එමගින් දේශීය කිරි නිෂ්පාදනය නංවාලීමට තුඩු දෙන පරිදි කෘත්‍රිම සිංචනය මගින් උපන් වැස්සි පැටවුන් ලියාපදිංචි කර තාක්ෂණික උපදෙස් සේවාවන් සහ අවශ්‍ය යෙදවුම් සඳහා සහනාධාර ගෙවීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වේ. සමාලෝචිත කාල සීමාව තුළදී වැස්සි පැටවුන් 16,042 ක් ලියාපදිංචි කර ඇත.

**ඇ. බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන**

බුරුළු ප්‍රදාහ තත්ත්වය පැතිර පැවතීම 30% සිට 1% දක්වා අඩු කිරීම මගින් ඵලදායිතාවය 25% ක් දක්වා වැඩිකිරීමේ අරමුණින් මෙම වැඩසටහන 2014 වසරේදී ආරම්භ කරන ලදී. 2019 සමාලෝචිත කාලසීමාව තුළ බුරුළු නික්ෂේපන 52,992 ක් නිෂ්පාදනය කරන ලදී.

#### 2.1.1.2. එළු ක්ෂේත්‍රය

උසස් ආරයේ අභිජනන එළුවන් සඳහා පවතින ඉල්ලුමට සරිලන ලෙස ඉඹුලන්දණ්ඩ සහ තෙලහැර පිහිටි එළු අභිජනන ගොවිපොළවල් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙම කාලය තුළදී නිෂ්පාදනය සහ ඵලදායිතාවය වැඩිකර ගැනීම උදෙසා එළු පාලනයේ නිරත ගොවීන්ට ජමුනාපාරි එළුවන් 98 දෙනෙකු ලබා දී තිබේ. තවද, එළු ගහනය වැඩිකිරීම උදෙසා 2019 දෙසැම්බර් මාසය වනවිට ක්ෂේත්‍ර මට්ටමින් කෘත්‍රිම සිංචනයන් 2,712 ක්ද සිදුකර තිබේ.

### 2.1.1.3. කුකුළු ක්ෂේත්‍රය

මෙරට කුකුළු කර්මාන්තය තුළ පෞද්ගලික අංශය සිදුකරනු ලබන කාර්යයන් පහසුකරණය කිරීම සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ප්‍රධාන වශයෙන් නීති සහ තත්ත්ව සහතික කිරීම සිදු කරනු ලබයි.

විදේශ රටවල කුරුළු උණ ව්‍යාප්ත වීම හේතුවෙන් මව්පිය සහ මුතුන් මිත්තන්ගේ පරම්පරාවලට අයත් සතුන් මෙරටට ආනයනය කිරීමේදී සීමාවන් පනවා එම රෝග මෙරටට සංක්‍රමණය වීම වැලැක්වීමට ගුවන් තොටුපල හා වරායන්හි පිහිටුවා ඇති සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථාන මගින් රෝග වලක්වාලීමේ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

බ්‍රොයිලර් මාපිය සතුන්ගේ අවශ්‍යතාවය දේශීය නිෂ්පාදනය මගින් හා ආනයනය මගින් සපුරා ගැනේ. වර්තමානයේ බ්‍රොයිලර් මාපිය සතුන්ගේ අවශ්‍යතාවයෙන් 80.2% ක් මෙරට බ්‍රොයිලර් මුතුන්මිත්තන් ඇති කරන ගොවිපොළ 03 ක් මගින් නිපදවනු ලබයි. 2019 දෙසැම්බර් මාසය වනවිට ප්‍රගතිය පහත පරිදි වේ.

| | |
|---|---|
| දේශීය නිෂ්පාදනය - බ්‍රොයිලර් මාපිය පරම්පරාවට අයත් සතුන් | 1,161,334 |
| ආනයනය - බ්‍රොයිලර් මුතුන් මිත්තන්ගේ පරම්පරාවලට අයත් සතුන් | 37,116 |
| - බ්‍රොයිලර් මාපිය පරම්පරාවට අයත් සතුන් | 286,707 |
| - ලේයර් මාපිය පරම්පරාවට අයත් සතුන් | 94,811 |

අභිජනන ගොවිපොළ මගින් මෙම කාලය තුළදී බ්‍රොයිලර් පැටවුන් මිලියන 167.99 ක් ද බිත්තර දමන කිකිළි පැටවුන් මිලියන 7.73 ක් ද නිෂ්පාදනය කරනු ලැබ ඇත. එසේම කුඩා පරිමාණ කුකුළු පාලන ගොවීන්ට නොමිලේ බෙදාදීම සඳහා පශු පර්යේෂණ ආයතනය විසින් රැනිකට් රෝගය සඳහා එන්නත් නිපදවනු ලැබේ. සමාලෝචිත කාල සීමාව තුළදී රැනිකට් එන්නත් සාර වඩි 4,104,400 ක් නිෂ්පාදනය කර ඇති අතර කුකුළන් 4,052,769 ක් සඳහා රැනිකට් එන්නත ලබාදී ඇත.

### 2.1.2. සත්ත්ව සෞඛ්‍යය වැඩිදියුණු කිරීම

#### අ. සතුන්ගේ බෝවන රෝග මැඩලීම

නිෂ්පාදනය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සෞඛ්‍ය සම්පන්න සත්ත්ව ගහනයක් පවත්වාගෙන යාමට මුළු දිවයින පුරා සාර්ථක අයුරින් රෝග වැලැක්වීම හා මර්දනය කිරීම පිණිස වන සත්ත්ව සෞඛ්‍ය සේවාවක් ලබාදීම උපරිම වැදගත්කමකින් යුතු වූවකි. ශ්‍රී ලංකාවේ බෝවන සත්ත්ව රෝග පැතිරීම වැලැක්වීම සඳහා එන්නත් කිරීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු සමඟ එක්වී ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා අවශ්‍ය වන කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා සහ බෘසෙල්ලා එන්නත් පශු පර්යේෂණ ආයතනය මගින් නිෂ්පාදනය කරන ලදී. තවද කුර සහ මුඛ රෝගය සඳහා එන්නත් වඩි 775,000 ක් ආනයනය කර ඇත. සමාලෝචිත කාල සීමාව තුළදී ප්‍රතිශක්තිකරණ වැඩසටහන යටතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරන ලද එන්නත් සහ ප්‍රතිශක්තිකරණය ලබා දුන් සතුන් ගණන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| එන්නත් වර්ගය | නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි ප්‍රමාණය | ප්‍රතිශක්තිකරණය ලබා දුන් සතුන් ගණන |
|---|---|---|
| කුර සහ මුඛ රෝග | 113,160 | 852,635 |
| රක්තාශ්‍රව රෝග | 388,872 | 227,635 |
| කාලගාත්‍රා | 263,505 | 124,452 |
| බෲසෙල්ලා | 18,000 | 6,931 |

**ආ. කුරුළු උණ මෙරටට ඇතුළුවීම වැලැක්වීම**

ආසියාවේ රටවල් කිහිපයක ආර්ථිකයට බලපෑ අතිව්‍යාධිජනක කුරුළු උණ රෝගයෙන් තොර රටක් ලෙස පැවතීමට ශ්‍රී ලංකාවට මේ දක්වා හැකියාව ලැබී ඇත. මෙරටට කුරුළු උණ ඇතුළුවුවහොත් එම රෝගය මැඩපවත්වා තුරන් කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් විධිමත් සැලැස්මක් සූදානම් කර ඇති අතර, මේ සම්බන්ධයෙන් රෝග ආවේක්ෂණ වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

පශු පර්යේෂණ ආයතනය සතු රෝග විනිශ්චය කිරීමේ පහසුකම් පුළුල් කෙරෙණි. ජාතික සහ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නිලධාරීන්ට අතිව්‍යාධිජනක කුරුළු උණ රෝගය වැලැක්වීමට සහ මැඩලීමට සම්බන්ධ පුහුණුවීම් ලබා දී ඇත.

මෙම අතිව්‍යාධිජනක කුරුළු උණ විමර්ශන වැඩසටහන යටතේ, ක්ෂේත්‍රයෙන් ලබාගත් සාම්පල 19,873 ක් මෙම කාලය තුළදී පරීක්ෂාවට භාජනය කරනු ලැබ ඇති අතර, ඒවා රෝගයෙන් තොර බවට තීරණය කෙරිණි.

**ඇ. සත්ත්ව නිරෝධායන සහ පරික්ෂා කිරීමේ සේවාව ශක්තිමත් කිරීම**

මෙරටට යම්කිසි ආගන්තුක (විදේශීය) සත්ත්ව රෝගයක් ඇතුළුවීමට එරෙහිව ඇති පළමු ඉදිරි ආරක්ෂක ක්‍රමය සත්ත්ව නිරෝධායන සේවාවයි. අභිජනන කුකුළන් ආනයනය කිරීමෙන් පසු නිරෝධායනය කිරීමට හා අපනයන වෙළෙඳපොළ සඳහා වන විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සෞඛ්‍යාරක්ෂිතව ගුණාත්මක බවින් නගාසිටුවීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය 2008 දී ආරම්භ කරන ලදී.

සමාලෝචිත කාල සීමාව තුළදී මෙම වැඩසටහන යටතේ ආනයනය කළ දිනක් වයසැති කුකුළු පැටවුන් කණ්ඩායම් 57 ක් නිරෝධායන පරික්ෂාවට භාජනය කරන ලදී. මීට අමතරව, මත්ස්‍ය ගොවිපොළවල් 120 ක්ද පරීක්ෂාවට ලක් කරන ලදී.

**ඈ. උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම**

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය මගින් උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම තවදුරටත් පුළුල් කිරීම සිදු කෙරේ. දැනට නිෂ්පාදනය කරන එන්නත් වල තත්වය වැඩිදියුණු කිරීමත්, නව එන්නත් අළුතෙන් නිෂ්පාදනයත් අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2019 වසරේදී කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා, බෲසෙල්ලා සහ රැනිකට් එන්නත් නිපදවීමට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කර ඇත.

**ඉ. පශු විමර්ෂණ මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම**

මෙම ව්‍යාපෘතිය මගින් හඳුනාගත් පශු විමර්ෂණ මධ්‍යස්ථාන වල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ කටයුතු ප්‍රාදේශීයව සිදුකිරීම සඳහා පරීක්ෂණාගාර නවීකරණය කිරීම සිදු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2019 දෙසැම්බර් මාසය වනවිට නවීකරණ කටයුතු වලින් 67% ක් පමණ අවසන් කර ඇත.

**2.1.3. මානව සම්පත් සංවර්ධනය**

**අ. හැකියා වර්ධනය, අධ්‍යාපනය සහ පුහුණුව**

දෙපාර්තමේන්තුව විසින් නවීන ප්‍රායෝගික සත්ත්ව පාලන කටයුතු සම්බන්ධයෙන් තාක්ෂණික නිලධාරීන් සහ ගොවීන්ට හැකියා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. සමාලෝචිත කාල සීමාව තුළදී පුහුණු වැඩසටහන් 15 ක් පවත්වා ඇති අතර, ව්‍යවසායකයින්/ නිලධාරීන් සහ ගොවීන් 361 ක් සඳහා පුහුණුව ලබාදී ඇත.

කරඳගොල්ලේ පිහිටි ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලය මඟින් සිසුන් 67 දෙනකු දෑඅවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවාගෙන ඇත (අධ්‍යයන වර්ෂ 2019 - 2021 සඳහා).

**ආ. තොරතුරු බෙදාහැරීම**

දෙපාර්තමේන්තුව ජාතික මට්ටමින් පවත්වන ලද ප්‍රදර්ශන 07 කට සහභාගීත්වය දක්වා ඇත. ඒවා පහත පරිදි වේ.

| ප්‍රදර්ශනයේ නම | පවත්වන ලද ස්ථානය |
|---|---|
| යොවුන් පුරය - 2019 | වීරවිල |
| Vet Expo - 2019 ප්‍රදර්ශනය | BMICH, කොළඹ |
| ශිල්ප සේනා තාක්ෂණික ප්‍රදර්ශනය | BMICH, කොළඹ |
| Vision 2025 - Enterprise Sri Lanka ප්‍රදර්ශනය | අනුරාධපුරය |
| කෘෂි මේලා 2019 - කෘෂිකර්ම ප්‍රදර්ශනය | රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය |
| Vision 2025 - Enterprise Sri Lanka ප්‍රදර්ශනය | යාපනය |
| ශිල්ප සේනා තාක්ෂණික ප්‍රදර්ශනය | පොළොන්නරුව |




යොවුන් පුරය - 2019




Vision 2025 - Enterprise Sri Lanka - යාපනය



Vision 2025 - Enterprise Sri Lanka - අනුරාධපුරය



කෘෂි මේලා 2019 - කෘෂිකර්ම ප්‍රදර්ශණය

දැනට සත්ත්ව පාලන කටයුතුවල නිරතව සිටින්නාවූ කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයින්ට සහ සත්ත්ව පාලන කටයුතුවල නිරතවීමට කැමති පාසල් සිසුන් සහ මහජනතාවට නව තාක්ෂණයන් සම්බන්ධ දැනුම සහ තොරතුරු ලබාදීම සිදුකරන ලදී. සමාලෝචිත කාල සීමාව තුළදී තොරතුරු අඩංගු පොත් 26,691 ක් අලෙවි කිරීමට සහ රූපවාහිනී සහ ගුවන්විදුලි ප්‍රචාරක වැඩසටහන් 93 ක් ඉදිරිපත් කිරීමට හැකි වී ඇත.

**2.1.4. නීතිමය කටයුතු සහ සේවාවන්**

**අ. කුකුළු ගොවිපොළ ලියාපදංචි කිරීම**

ප්‍රාදේශිය පශු වෛද්‍ය කාර්යාල මගින් කුකුළු ගොවිපොළ ලියාපදිංචි කිරීම 2019 වර්ෂයේදී ද ක්‍රියාත්මක විය. කුකුළු ගොවිපොළවල් ලියාපදිංචි කිරීමේ වැඩසටහන මගින් බෝවන රෝග මර්දනය කිරීම, තාක්ෂණික සහාය වැඩසටහන් පැවැත්වීම සහ සත්ත්ව නිෂ්පාදනවල ගුණාත්මකභාවය පාලනය කිරීම පහසුවෙන් කරගෙන යාමට හැකි වේ. ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් 2019 දෙසැම්බර් මස අවසානය වන විට ප්‍රාදේශීය නිදැලි කුකුළු ගොවිපොළවල් 29,621 ක් හා වාණිජ  කුකුළු ගොවිපොළවල් 2,172 ක් ලියාපදිංචිකර ඒ සම්බන්ධව විද්‍යුත් දත්ත සමුදායක් ස්ථාපිත කර ඇත.

**ආ. සතුන් හඳුනාගැනිමේ වැඩසටහන සහ මධ්‍යම දත්ත සමුදායක් ස්ථාපිත කිරීම**

මෙම  ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන්ගේ කන් සලකුණු කිරීම සිදුකරනු ලබයි. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට සතුන් 105,900 දෙනෙකුගේ කන් සලකුණු සවිකර ඇත. ඉතිරි සත්ත්ව ගහනය සහ ඔවුන්ගේ පැටවුන් ඉදිරි වර්ෂවලදී හඳුනා ගැනේ. මෙය සත්ත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ ඝාතනය වැළැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය හා ඵලදායි නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාර වේ.

**ඈ. රජයේ පශු වෛද්‍ය කාර්යාල මගින් සිදුකරන සේවා සැපයීමේ ක්‍රමවේදය වැඩි දියුණු කිරීම**

ග්‍රාමීය ප්‍රදේශවල සත්ත්ව පාලන අංශයේ නියුතුවූවන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන ක්ෂේත්‍ර මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන් වනුයේ රජයේ පශු වෛද්‍ය කාර්යාලයන්ය. බිම් මට්ටමින් සේවාවන් සැපයීමේ කාර්යක්ෂමතාවය මෙකී කාර්යාලයන් සතුව පවතින පහසුකම් මත රඳා පවතී. සැලකිය යුතු පශු වෛද්‍ය කාර්යාල සංඛ්‍යාවක රෝග විනිශ්චය කිරීම, ව්‍යාප්ති සේවාවන්, සන්නිවේදනය සහ ප්‍රවාහනය සඳහා පහසුකම් පවතින්නේ අවම මට්ටමෙනි.

2017, 2018 වසරේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලය පශු වෛද්‍ය කාර්යාලය, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර පශු වෛද්‍ය කාර්යාලය, රත්නපුර දිස්ත්‍රික්කයේ අයගම පශු වෛද්‍ය කාර්යාලය, මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ පශු වෛද්‍ය කාර්යාලය, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අරලගන්විල පශු වෛද්‍ය කාර්යාලය, මඩකලපුව දිස්ත්‍රික්කයේ කළුවන්චිකුඩි පශු වෛද්‍ය කාර්යාලය සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ පූඩළුඔය යන පශු වෛද්‍ය කාර්යාලයන්හි ඉදි කිරීම් 2019 අවසානය වන විට නිමවා ඇත. 2019 වසරේ ආරම්භ කළ බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල පශු වෛද්‍ය කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු 2019 අවසානය වන විට 40% ක් පමණ වන අතර එය 2020 වසර සඳහා අවිච්ඡේද වේ.



ඉදිකිරීම් අවසන් කළ පස්ගොඩ පශු වෛද්‍ය කාර්යාලය හා නිල නිවස



ඉදිවෙමින් පවතින හාලිඇල පශු වෛද්‍ය කාර්යාලය

**2.1.5. පශු මහජන සෞඛ්‍ය සේවාවන්**

**අ. ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු පහසුකරණය සඳහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම**

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය හරහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම මගින් අපනයන පහසුකරණය සහ ආහාර ආරක්ෂණය තහවුරු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයේදී පශු පර්යේෂණ ආයතනයේ, සත්ත්ව පෝෂණ අංශයේ පවතින විද්‍යාගාරය වැඩි දියුණුකර ඇත. එමෙන්ම සත්ත්ව ආහාර හා සත්ත්ව නිෂ්පාදන සාම්පල 6,211 ක ගුණාත්මකභාවය විශ්ලේෂණය කර ඇත.

### 2.2. 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ව්‍යාපෘති

2019 වසරේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් 2020 වසරේදී ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

**2.2.1. පශු සම්පත් සංවර්ධනය**

**අ. උසස් ආරයේ වැස්සි පැටවුන් සුලභ කිරීමේ ව්‍යාපෘතිය**

මේ යටතේ 2020 වසරේදී වැස්සියන් 17,000 ක් ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වේ.

**2.2.2 සත්ත්ව සෞඛ්‍ය වැඩිදියුණු කිරීම**

**අ. සතුන්ගේ බෝවන රෝග මැඩලීම**

ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා අවශ්‍ය වන කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා සහ බෘසෙල්ලා එන්නත් පශු පර්යේෂණ ආයතනය මගින් නිෂ්පාදනය කරනු ලබයි. 2020 කාල සීමාව තුළදී ප්‍රතිශක්තිකරණ වැඩසටහන යටතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිශක්තීකරණය කිරීමට බලාපොරොත්තු වන සතුන් ප්‍රමාණය පහත පරිදි වේ.

| එන්නත් වර්ගය | ප්‍රතිශක්තීකරණය කිරීමට බලාපොරොත්තුවන සතුන් ප්‍රමාණය |
|---|---|
| කුර සහ මුඛ රෝග | 720,000 |
| කාලගාත්‍රා | 220,000 |
| රක්තාශ්‍රව රෝග | 100,000 |

**ආ. උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම**

එන්නත් නිෂ්පාදන ක්‍රියාදාමය නවීකරණය සඳහා එන්නත් නිෂ්පාදන පරීක්ෂණාගාර සංකීර්ණය නවීකරණය කිරීම සිදු කරයි.

**ඇ. වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන**

වනජීවී රෝග ආවේක්ෂණය දීප ව්‍යාප්තව පුළුල් කිරීම සඳහා සම්බන්ධීකරණ ඒකකයක් පිහිටුවීම, පරීක්ෂණාගාර නවීකරණය සහ වැඩිදියුණු කිරීම ඇතුළු වනජීවී රෝග ආවේක්ෂණය පිළිබඳ නිලධාරීන් සහ පාර්ශවකරුවන් සඳහා හැකියා සංවර්ධනය මෙමගින් සිදු කරනු ලැබේ.

**2.2.3. නීතිමය කටයුතු සහ සේවාවන්**

**අ. සතුන් හඳුනාගැනීමේ වැඩසටහන සහ මධ්‍යම දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම**

සතුන් හඳුනාගැනීම සහ මධ්‍යම දත්ත සමුදායක් ස්ථාපිත කිරීම උදෙසා 2010 වසරේදී ආරම්භ කළ මෙම වැඩසටහන 2020 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන්ගේ කන් සලකුණු කිරීම සිදුකරනු ලබයි. මෙය සත්ත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ ඝාතනය වැලැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය සහ ඵලදායී නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාරී වේ. 2020 වර්ෂය සඳහා සතුන් 14,000 ක් සඳහා කන් සළකුණු කිරීමට බලාපොරොත්තු වේ.

ආ. සත්ත්ව සහ කුකුළු ගොවිපොළ ලියාපදිංචි කිරීම

සත්ත්ව හා කුකුළු ගොවිපොළ ලියාපදිංචි කිරීමේ වැඩසටහන 2020 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත. මීට අමතරව, ගොවිපොළ ලියාපදිංචි කිරීමේ වැඩසටහන සඳහා ප්‍රාදේශීය මට්ටමේ අන්තර්ජාල පාදක දත්ත සමුදායක් නිර්මාණය කෙරේ.

2.2.4. පශු මහජන සෞඛ්‍ය සේවාවන්

අ. සත්ව ආහාර වල ගුණාත්මකභාවය සහතික කිරීම

අපනයන කටයුතු පහසුකරණය සඳහා ආහාරවල ගුණාත්මකභාවය රසායනාගාර පරීක්ෂණ මගින් තහවුරු කිරීම මෙහි අරමුණ වේ. ප්‍රමිතිගත විශ්ලේෂණ වාර්තා ලබාදීම සඳහා විශ්ලේෂණයන් සිදුකිරීමට අවශ්‍ය සත්ව පෝෂණ පරීක්ෂණාගාරය වැඩිදියුණු කිරීම හා පරීක්ෂණාගාර පහසුකම් වැඩිදියුණු කිරීම අපේක්ෂා කරයි.

ඊට අමතරව, නව ව්‍යාපෘති 07 ක් සඳහා ව්‍යාපෘති යෝජනා 2019 වසරේ ජුනි මස අමාත්‍යාංශය වෙත යවා ඇත. එම ව්‍යාපෘතීන් ඉදිරි අයවැයෙන් අනුමත වූ පසු ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

| ව්‍යාපෘතිය | කාල සීමාව | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) | අරමුණු |
|---|---|---|---|
| පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 5/6) ලබාගැනීමට ඉගැන්වීම්, පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම. | අවු. 05 | 75.00 | 2020 වර්ෂයේ අවසානයට පෙර දෑ අවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 5/6) මට්ටමේ සියළු වැඩ කටයුතු සම්පූර්ණ කිරීම. |
| පශු සම්පත් ක්ෂේත්‍රයේ ව්‍යවසායක හා කුඩා ව්‍යාපාර වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැපයීම. | අවු. 05 | 18.00 | පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා යොමුවන නව ව්‍යවසායකයින්ගේ තාක්ෂණික දැනුම හා ප්‍රායෝගික කුසලතාවයන් වැඩිදියුණු කිරීම |
| දේශගුණික කලාප සඳහා අභිජනන පරාමිතීන් සැකසීම තුළින් කිරිගව ක්ෂේත්‍රයේ නිෂ්පාදනය ඉහළ නැංවීම | අවු. 05 | 18.00 | එක් එක් දේශගුණික කලාපවලට අදාලව අභිජනන පරාමිතීන් ගොඩනැගීම තුළින් කුඩා පරිමාණ කිරි ගොවිපළ නිෂ්පාදන ඉහළ නැංවීම |
| තරුණ පරපුර ආකර්ශණය කර ගැනීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක මට්ටමේ ආර්ථික ඵලදායීතාවයෙන් යුතු ආදර්ශ ගොවිපළ ඇති කිරීම. | අවු. 05 | 78.00 | තරුණ පරපුර කිරි ගව ක්ෂේත්‍රයට යොමු කර ගැනීම තුළින් නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම. |
| සතුන් තුළ ප්‍රතිජීවක සඳහා ගොඩ නැගෙන ප්‍රතිරෝධතාවය වළක්වා ගැනීම මගින් මහජන සෞඛ්‍ය දියුණු කිරීම | අවු. 05 | 152.00 | සතුන් තුළ හා මහජනතාව තුල ප්‍රතිජීවක සඳහා ගොඩ නැගෙන ප්‍රතිරෝධතාවය අවම කිරීම |
| පශු විමර්ශණ පහසුකම් සහ ජෛව ආරක්ෂණ මට්ටම ඉහළ දැමීම සඳහා මධ්‍යම පශු විමර්ශණ මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම. | අවු. 05 | 200.00 | මධ්‍යම පශු විමර්ශණ මධ්‍යස්ථාන මගින් සපයන සේවාවන් වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම. |
| සත්ත්ව සෞඛ්‍ය වැඩිදියුණු කිරීම | අවු. 05 | 60.00 | මහා පරිමාණ හා වාණිජ ගොවිපළ වල ජෛව ආරක්ෂණය ඉහළ නැංවීම තුළින් සත්ත්ව සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ රෝග පැතිර යාම අවම කිරීම |

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය හා ඉදිරි දැක්මට අදාළව දෙවන පරිච්ඡේදය මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි



[illegible]
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

3. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-01

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

රු.

| අයවැය 2019 | | සටහන | සත්‍ය 2019 | සත්‍ය 2,018 | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම | | 84,973,991 | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 84,973,991 | - | |
| - | මුළු ආදායම් ලැබීම (අ) | | 84,973,991 | - | |
| - | ආදායම් නොවන ලැබීම | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,303,570,000 | 1,059,834,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 17,096,397 | 21,583,962 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 31,253,172 | 32,459,492 | ඒසීඒ-5/5(අ)/5(ආ) |
| - | වෙනත් ලැබීම් | | - | 73,029,474 | |
| - | මුළු ආදායම් නොවන ලැබීම (ආ) | | 1,351,919,570 | 1,186,906,928 | |
| - | මුළු ආදායම් ලැබීම සහ ආදායම් නොවන ලැබීම ඇ = (අ)+(ආ) | | 1,436,893,561 | 1,186,906,928 | |
| | අඩුකළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | ඒසීඒ-2(ii) |
| 466,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 463,208,230 | 424,633,218 | ඒසීඒ-2(ii) |
| 565,275,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 96,251,756 | 90,715,376 | ඒසීඒ-2(ii) |
| 21,491,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 21,248,032 | 10,907,937 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| 1,052,766,000 | මුළු පුනරාවර්තන වියදම් (ඈ) | | 580,708,017 | 526,256,531 | |
| | මූලධන වියදම් | | | | |
| 47,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 42,777,576 | 31,147,462 | ඒසීඒ-2(ii) |
| 41,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 11,855,517 | 21,964,322 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 33,000,000 | හැකියා වර්ධනය | 14 | 32,669,051 | 25,120,126 | ඒසීඒ-2(ii) |
| 792,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 706,155,928 | 457,137,262 | ඒසීඒ-2(ii) |
| 913,000,000 | මුළු මූලධන වියදම් (ඉ) | | 793,458,071 | 535,369,172 | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඊ) | | 55,809,844 | 62,312,893 | |
| | තැන්පතු ගෙවීම් | | 13,584,269 | 18,480,252 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 42,225,575 | 43,832,641 | 5/5(අ)/5(ආ) |
| | මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ) | | 1,429,975,932 | 1,123,938,596 | |
| - | 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ) | | 6,917,629 | 62,968,332 | |

000002

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2019 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,380,948,039 | 2,173,615,163 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 103,499,959.49 | 92,527,557 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 2,083,898.93 | - |
| මුළු වත්කම් | | **2,486,531,897** | **2,266,142,720** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| ශුද්ධ වත්කම් | | 78,394,185 | 70,933,911 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,380,948,039 | 2,173,615,163 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 25,105,774.36 | 21,593,646.00 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 2,083,899 | - |
| මුළු වගකීම් | | **2,486,531,897** | **2,266,142,720** |

පිටු අංක ..02... සිට ...48.. දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක .54.A.. සිට .101.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් පෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ......................... | ......................... | ......................... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : | දිනය : 2020.2.24 | දිනය : |

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය
අංක. 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

දිශාවිද්‍ය කේ.ඩී. ආරියපාල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

ඩබ්. සිවකි
ප්‍රධාන ගණකාධිකාරී
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. පෙ. 13
ගැටඹේ - පේරාදෙණිය

000003

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

| | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| මුළු බදු ලැබීම | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | 51,154,589 | 1,131,409,970 |
| වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම් | | - | - |
| අග්‍රිම ලැබීම් | | 1,303,570,000 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | | 1,354,724,589 | 1,131,409,970 |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 407,497,147 | 515,348,594 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 113,412,980 | 10,907,937 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 1,587,591 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | - | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | | 522,497,718 | 526,256,531 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ) | | 832,226,871 | 605,153,439 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| පොළී | | | |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම | | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම | | 916,795 | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | | 916,795 | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම | | 784,735,323 | 535,369.172 |
| අත්තිකාරම් ගෙවීම | | 39,595,420 | - |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | | 824,330,743 | 535,369,172 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ) | | (823,413,948) | (535,369,172) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ) | | 8,812,924 | 69,784,267 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දේශීය ණය ගැනීම | | - | - |
| විදේශීය ණය ගැනීම | | - | - |
| ප්‍රදානයන් ලැබීම | | - | - |
| තැන්පතු ලැබීම | | 6,291,257 | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | | 6,291,257 | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | | |
| දේශීය ණය ආපසු ගෙවීම | | | |
| විදේශීය ණය ආපසු ගෙවීම | | - | - |
| තැන්පතු ගෙවීම | | - | - |
| | | 13,020,282 | 69,784,267 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | | 13,020,282 | 69,784,267 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | | (6,729,025) | (69,784,267) |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) -(ඒ) | | 2,083,899 | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | | 2,083,899 | - |

000004

**3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්**

**1. වාර්තාකරණ කාලපරිච්ඡේදය**
2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර, සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3. ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර, පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථා වලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

**5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**
මෙම සංචිත ගිණුම, දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුමවේ.

**6. මුදල් හා මුදල් සමාන දෑ**
2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි වලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

## 3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ඇමුණුම - 1(iii)

### සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ සත්‍ය ආදායම අතර විචලතා පැහැදිලි කිරීම

ආදායම් ගණන් දීමේ නිලධාරී :සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය :292

රු.

| ආදායම් සංකේතය | විස්තරය | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | සත්‍ය ආදායම | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා සත්‍ය ආදායම අතර වෙනස | වෙනස සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|
| 2002.01.00 | කුලී | | 8,918,660 | 8,918,660 | | |
| 2002.01.99 | අනෙකුත් කුලී | 500,000 | - | (500,000) | (100.00) | මෙම ආදායම් ශීර්ෂ සඳහා |
| 2002.02.99 | වෙනත් | 3,000,000 | 3,633,916 | 633,916 | 21.13 | ඇස්තමේන්තු සකස් කිරීම |
| 2003.01.00 | දෙපාර්තමේන්තුමය විකිණීම් | 45,000,000 | 14,648,661 | (30,351,339) | (67.45) | ප්‍රායෝගික අපහසු නිසා |
| 2003.02.99 | විවිධ | | 3,557,462 | 3,557,462 | | මෙම විචලතාවය ඇතිවිය. |
| 2003.03.00 | දඩමුදල් හා රාජසන්තක කිරීම් | | | | | |
| | රජයේ නිලධාරීන්ට ලබාදෙන යතුරුපැදි | | | | | |
| 2003.04.00 | සම්බන්ධ මූලික ගෙවීම් | | 10,000 | 10,000 | | |
| 2003.99.00 | අනෙකුත් ලැබීම් | 1,200,000 | 34,562,257 | 33,362,257 | 2,780 | |
| 2004.01.00 | සමාජ සංරක්ෂණ දායක මුදල් | | 19,643,035 | 19,643,035 | | |

2020.2.28
දිනය

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
මූල්‍ය අංශයේ ප්‍රධානී නම සහ අත්සන
ජේ. කරුණ
ප්‍රධාන ගණකාධිකාරී
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. පෙ. 13
ගැටඹේ - පේරාදෙණිය

ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ අත්සන
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ නම
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ තනතුර:

වෛද්‍ය කේ.ඩී. අරියපාල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

000010

### 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ඒසිර් -2

#### 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : 292

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

රු.

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වියදමේ නම | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | අතිරේක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) | මුළු ඇද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුළු වියදම (5) | ඇද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5) |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන (1) | (1) පුනරාවර්තන | 574,000,000 | 12,766,000 | 0 | 586,766,000 | 580,708,017 | 6,057,983 |
| | (2) ප්‍රාග්ධන | 70,000,000 | 59,000,000 | 0 | 129,000,000 | 95,112,289 | 33,887,711 |
| | උප එකතුව | 644,000,000 | 71,766,000 | - | 715,766,000 | 675,820,306 | 39,945,694 |
| වැඩසටහන (2) | (1) පුනරාවර්තන | | | | | | |
| | (2) ප්‍රාග්ධන | 654,000,000 | 105,000,000 | | 759,000,000 | 698,345,782 | 60,654,218 |
| | උප එකතුව | 654,000,000 | 105,000,000 | - | 759,000,000 | 698,345,782 | 60,654,218 |
| | මුළු එකතුව | 1,298,000,000 | 176,766,000 | - | 1,474,766,000 | 1,374,166,088 | 100,599,912 |

.........................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :2020.02.25

ජේ. සරත්
ප්‍රධාන ගණකාධිකාරී
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. පෙ. 13
ගැටඹේ - පේරාදෙණිය.

000011

**3.7. මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

| | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුදල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය | අභ්‍යාසලාභී, උපාධි පුහුණු ලාභීන්ගේ දීමනා ගෙවීම සඳහා | 1,020,000 | | 1,020,000 | 100% |

**3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය**

| වත්කම් කේතය | කේත විස්තරය | 2019.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | 817,625.557 | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | - | 303,866.013 | - | - |
| 9153 | ඉඩම් | - | 1,259,456.469 | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | | - | - |

**3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව - ඇමුණුම I**

## 4. කාර්යසාධන දර්ශක

### 4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100%-90% | 75%-89% | 50%-74% |
| 1 | දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන/වසරකට) | ✓ | | |
| 2 | වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර ගණන/වසරකට) | ✓ | | |
| 3 | වාර්ෂික ඒකපුද්ගල කුකුළු මස් පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (කි.ග්‍රෑම් වසරකට) | ✓ | | |
| 4 | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය වැඩිවීමේ ප්‍රමාණය | | | ✓ |

## 5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

### 5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය/අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49 | 50%-74% | 75%-100% |
| (I) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම | වසර 2020 වන විට දේශිය කිරි නිෂ්පාදනය ලීටර මිලියන 440 දක්වා ඉහල නැංවීම | දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන/වසරකට) | | | ✓ |
| (II) සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | වසර 2020 වන විට වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය 130 දක්වා ඉහල නැංවීම | වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර ගණන/වසරකට) | | | ✓ |
| | වසර 2020 වන විට වාර්ෂික ඒකපුද්ගල කුකුල් මස් පරිභෝජනය කිලෝ ග්‍රෑම් 10 දක්වා ඉහල නැංවීම | වාර්ෂික ඒකපුද්ගල කුකුල් මස් වැඩිවීමේ ප්‍රමාණය (කුකුල් මස් කිලෝ ග්‍රෑම් /වසරකට) | | | ✓ |
| (III) ආර්ථික වර්ධන වේගය ඉහළ නැංවීම | කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ සත්ත්ව නිෂ්පාදන අංශයේ වර්ධන වේගය 5% දක්වා ඉහළ නැංවීම. | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 1%-1.5% කින් වැඩිවීමේ ප්‍රමාණය | | ✓ | |

## 6. මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 194 | 141 | **53** |
| තෘතීයික | 22 | 17 | **05** |
| ද්විතීක | 340 | 301 | **39** |
| ප්‍රාථමික | 395 | 293 | **102** |

### 6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනයක් වේ. වර්තමානයේ මෙම දෙපාර්තමේන්තුව මහවැලි කෘෂිකර්ම,වාර්මාර්ග සහා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වේ. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුව රට තුල සත්ත්ව රෝග පැතිරීම වැලැක්වීම, සත්ත්ව ආහාර, පශු ඖෂධ, පශු නිෂ්පාදන හා ජෛවීය ද්‍රව්‍ය නියාමනය, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ හා සංවර්ධන කටයුතු, අන්තර්ජාතික වෙළඳාම පහසුකරණය, තාක්ෂණික දැනුම බෙදාදීම , සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ දැනුම ලබා දීම සහ සත්ත්ව පාලනය සම්බන්ධයෙන් පුහුණු ලබා දීම, ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ අවශ්‍ය උපදෙස් ලබා දීම යනාදිය සඳහා මහත් සේවාවක් ඉටුකරයි.

මානව සම්පත් හිඟය තුලින් නිරෝගීමත් සත්ත්ව ගහණයක් හා වැඩි නිෂ්පාදන ඵලදායතාවයකින් යුතු ආහාර සුරක්ෂිත තාවයක් හා ආහාරයන්හි සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීම් ක්ෂේත්‍රයේ පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් ලබා දීම උදෙසා තාක්ෂණික මඟ පෙන්වීම හා සහාය ලබා දීමේදී අදාල කාර්යභාරයන් මැනවින් ඉටු කිරිමට අවශ්‍ය කාර්ය මණ්ඩල හිඟකම නිසා ආයතනික ඉලක්ක හා අරමුණු ලගා කර ගැනීමේදී බාධා මතුවේ.

6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු,000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Regional Workshop on Animal Feed Safety | 1 | දින 03 | | | විදේශීය | පුද්ගල හැකියා වර්ධනය තුළින් ආයතනයේ සමස්ථ කාර්ය සාධනය වැඩි වේ. |
| Sri Lanka Nederland Food Safety Cooperation Study | 1 | දින 07 | | | විදේශීය | එම |
| OIE Regional Orientation Training for SAARC Countries | 1 | දින 03 | | | විදේශීය | එම |
| PVS Pathway orientation training workshop for south Asia | 3 | දින 03 | | | විදේශීය | එම |
| Regional Workshop on underutilized animal genetic resources and their amelioration | 1 | දින 02 | | | විදේශීය | එම |
| Selection and Importation of Boer Goats | 2 | දින 08 | | | විදේශීය | එම |
| Laboratory Proficiency testing workshop | 1 | දින 03 | | | විදේශීය | එම |
| Consultation Meeting on Identification of Best Practices in Livestock Feed & Fodder Production and Management | 1 | දින 02 | | | විදේශීය | එම |
| OIE Global Conference on Aquatic Animal Health Collaboration, Sustainability: Our Future | 1 | දින 02 | | | විදේශීය | එම |
| 8th Asia- Pacific Workshop on Multi-sect oral Collaboration of the Animal - Human Ecosystems interface | 1 | දින 02 | | | විදේශීය | එම |
| Seminar on Safety Governance of Agricultural Livestock & Fishery Products for Asian Countries | 1 | දින 06 | | | විදේශීය | එම |
| Hands on Training " Standardized and Harmonized Surveillance Methods for Antimicrobial Resistance in Food in South Asia | 2 | දින 03 | | | විදේශීය | එම |
| Regional Training Of trainers (TOT) on management of Agriculture, livestock and Forest Based Water Pollution | 1 | දින 03 | | | විදේශීය | එම |
| Regional Seminar for OIE National Focal Point for Veterinary Laboratories | 1 | දින 07 | | | විදේශීය | එම |
| Rural Development through Creating Agricultural Value chain | 1 | දින 27 | | | විදේශීය | එම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු,000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| The First SAARC Regional Animal Health Laboratory Technical Advisory Group (Lab- TAG) meeting. | 1 | දින 01 | | | විදේශීය | එම |
| In-country stepwise approach towards rabies Elimination (SARE) workshop | 3 | දින 02 | | | විදේශීය | එම |
| In-country stepwise approach towards rabies Elimination (SARE) workshop | 1 | දින 05 | | | විදේශීය | එම |
| "The Seventh meeting of the SAARC Chief veterinary Officers' (CVOs) Forum" | 2 | දින 01 | | | විදේශීය | එම |
| Regional workshop on Antimicrobial Resistance (AMR) in Asia | 1 | දින 02 | | | විදේශීය | එම |
| Breeder Management Training Course | 1 | දින 11 | | | විදේශීය | එම |
| The 1st meeting of the AMR Technical Advisory Group (TAG) of South Asia | 2 | දින 03 | | | විදේශීය | එම |
| Technical Assistance to the Modernization of Agriculture Program ( TAMAP) Stakeholder Tour | 1 | දින 08 | | | විදේශීය | එම |
| Public Policy Development and Public Engagement Program - 2019 | 1 | දින 04 | | | විදේශීය | එම |
| Doctor of Philosophy (PhD) | 1 | අවු. 03 | | | විදේශීය | එම |
| System & Species diversification | 1 | දින 08 | | | විදේශීය | එම |
| Establishment of international collaborating center for tick - borne protozoan diseases | 1 | දින 05 | | | විදේශීය | එම |
| South Asia one Health Disease Surveillance Network workshop | 1 | දින 01 | | | විදේශීය | එම |
| OIE Regional Expert Group Meeting for Diseases of Poultry in Asia and the Pacific region | 1 | දින 01 | | | විදේශීය | එම |
| Feed Milling Technology Forum | 1 | දින 01 | | | විදේශීය | එම |
| Factory Acceptance Test: Supply of the Equipment Steam Sterilizer under "Production of Compatible and high quality Animal Vaccine Locally for Substitution of Vaccine imported" project | 1 | දින 03 | | | විදේශීය | එම |
| "Regional training workshop for public private partnership in the Veterinary domain " | 1 | දින 01 | | | විදේශීය | එම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු,000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| FMD Vaccine - pre shipment inspection and proceeding | 2 | දින 02 | | | විදේශීය | එම |
| BTSF Training on Sampling & Analysis: Course Residues of VMP - TS03 | 1 | දින 11 | | | විදේශීය | එම |
| OIE Regional Workshop for OIE Focal Points for Animal Welfare in the Region of Asia and the Pacific | 1 | දින 03 | | | විදේශීය | එම |
| "Regional workshop for supporting analytical capacity in the Livestock sector in Asian countries using LSIPT and GLEAM - " | 2 | දින 03 | | | විදේශීය | එම |
| Board of Survey | 98 | දින 01 | 50,398.00 | | දේශීය | එම |
| Information Technology - MS Access | 15 | දින 03 | 5,003.00 | | දේශීය | එම |
| Office Management Systems | 51 | දින 01 | 31,606.00 | | දේශීය | එම |
| General Administration & Financial Regulation (Refresher Training) | 18 | දින 03 | 58,073.00 | | දේශීය | එම |
| General Administration & Finance -1 | 40 | දින 03 | 75,387.00 | | දේශීය | එම |
| Information Technology - MS Excel | 14 | දින 02 | 24,155.00 | | දේශීය | එම |
| AR & FR | 13 | දින 01 | 12,386.00 | | දේශීය | එම |
| Bovine Viral Disease (BVD)-1 | 41 | දින 01 | 40,686.00 | | දේශීය | එම |
| Information Technology - MS Excel | 11 | දින 02 | 29,773.00 | | දේශීය | එම |
| Training on Feeding and Management of Dairy Cattle | 30 | දින 03 | 75,115.00 | | දේශීය | එම |
| Bovine Viral Disease (BVD)-2 | 30 | දින 01 | 33,775.00 | | දේශීය | එම |
| Livestock Waste Management | 29 | දින 01 | 26,009.00 | | දේශීය | එම |
| Stress Management | 39 | දින 01 | 5,400.00 | | දේශීය | එම |
| Swine Management | 29 | දින 02 | 51,608.00 | | දේශීය | එම |
| Silage Making | 32 | දින 01 | 28,070.00 | | දේශීය | එම |
| Training on Losses & Damages | 76 | දින 01 | 39,290.00 | | දේශීය | එම |
| Bovine Viral Disease (BVD)-3 | 49 | දින 01 | 71,150.00 | | දේශීය | එම |
| Immerging Economically Important Diseases of Livestock-FMD | 34 | දින 01 | 53,160.00 | | දේශීය | එම |
| Extension & Commiunication-1 | 43 | දින 03 | 85,646.00 | | දේශීය | එම |
| Stress Management | 64 | දින 01 | 24,763.00 | | දේශීය | එම |
| Information Technology - MS Excel | 13 | දින 02 | 21,208.00 | | දේශීය | එම |
| Management of Breeding Disorders of Cattle & Buffalo- | 21 | දින 03 | 55,559.00 | | දේශීය | එම |
| Stress Management | 46 | දින 01 | 22,190.00 | | දේශීය | එම |
| Information Technology - MS Excel | 14 | දින 02 | 23,720.00 | | දේශීය | එම |
| Administrative & Financial Regulations | 55 | දින 03 | 109,945.00 | | දේශීය | එම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු,000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Dairy Cattle Feeding | 39 | දින 01 | 29,939.00 | | දේශීය | එම |
| Training Programme on Establishment of Economically Efficient Dairy Farm | 75 | දින 04 | 21,600.00 | | දේශීය | එම |
| Training Programme on Establishment of Economically Efficient Dairy Farm | 63 | දින 02 | 121,504.00 | | දේශීය | එම |
| Training Programme on Establishment of Economically Efficient Dairy Farm | 60 | දින 02 | 10,800.00 | | දේශීය | එම |
| Information Technology - MS Access | 12 | දින 03 | 31,632.00 | | දේශීය | එම |
| Modern Poultry Management | 48 | දින 01 | 24,055.00 | | දේශීය | එම |
| Training on Preparation of Silage | 35 | දින 01 | 26,360.00 | | දේශීය | එම |
| Contagious Diseases (FMD/HS/BQ) Control | 46 | දින 01 | 30,311.00 | | දේශීය | එම |
| Guidance for Satisfied Professional Life | 48 | දින 01 | 28,968.00 | | දේශීය | එම |
| Induction Training Programme on for newly recruited Veterinary Surgeons | 37 | දින 21 | 871,501.00 | | දේශීය | එම |
| Aqua Culture & Aquatic Diseases Prevention & control | 26 | දින 01 | 24,105.00 | | දේශීය | එම |
| Livestock Project Proposal Writing | 45 | දින 02 | 67,230.00 | | දේශීය | එම |
| Language Training Programme for AP&H Officers | 89 | දින 18 | 934,383.00 | | දේශීය | එම |
| General Administration & Finance -2 | 23 | දින 03 | 73,880.00 | | දේශීය | එම |
| Modern Dairy Management | 36 | දින 01 | 27,134.00 | | දේශීය | එම |
| Extension & Commiunication-2 | 51 | දින 03 | 122,128.00 | | දේශීය | එම |
| Residential Training/ Learning & Development programme on Management- Group 01 | 76 | දින 04 | 605,050.00 | | දේශීය | එම |
| Residential Training/ Learning & Development programme on Management - Group 02 | 80 | දින 04 | 623,579.00 | | දේශීය | එම |
| Residential Training/ Learning & Development programme on Management - Group 03 | 76 | දින 04 | 620,818.00 | | දේශීය | එම |
| Training Programme on Establishment of Economically Efficient Dairy Farm | 54 | දින 04 | 144,030.00 | | දේශීය | එම |
| Residential Training/ Learning & Development programme on Management - Group 04 | 64 | දින 04 | 590,600.00 | | දේශීය | එම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු,000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Rights & Responsibilities of Public Service Commission | 46 | දින 01 | 28,120.00 | | දේශීය | එම |
| Training Programme on Establishment of Economically Efficient Dairy Farm | 45 | දින 04 | 487,515.00 | | දේශීය | එම |
| Residential Training/ Learning & Development programme on Management – Group 05 | 41 | දින 04 | 511,728.00 | | දේශීය | එම |
| Training on Procurement | 64 | දින 01 | 35,250.00 | | දේශීය | එම |
| Duties, Responsibilities and Safety of Government Drivers | 34 | දින 01 | 23,970.00 | | දේශීය | එම |
| ජීවත්වීමේ කලාව මනෝවිද්‍යාත්මක ඇසින් පුහුණු වැඩසටහන | 89 | දින 01 | 46,251.00 | | දේශීය | එම |

7. අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | | මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ. |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ. |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.6 | වෙනත් | | | |
| 2 | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 3 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA 1-2019 අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | ඇතැම් විගණන වාර්තා සඳහා පිළිතුරු පමා වේ. | සිහිකැඳවීම් යවමින් පසු විපරම් කිරීම |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3)ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාන්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විකණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06ට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | අපහරණය සිදුකිරීමට අදාල ක්‍රියාවලිය නිසිකලට ක්‍රියාත්මක නොවීම හා අදාල මණ්ඩල මගින් නිසිකලට කටයුතු සිදු නොකිරීම | නිසිකලට වාහන වල තත්වය පරීක්ෂා කිරීම හා අවශ්‍ය අවස්ථාවන්හිදී අලුත්වැඩියා කිරීම් කඩිනමින් සිදුකිරීම අදාල අධීක්ෂණ ක්‍රමවේදයක් සැකසීම හා පසුවිපරම් අඛණ්ඩව නොකඩවා සිදු කිරීම |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්දන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| **10.** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11.** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12.** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **13.** | **පොදු තැන්පත් ගිණුම්** | | | |
| 13.1 | කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14.** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල නොවේ | විශේෂ හේතුමත ස්ථාන මාරු වීම් ලබා දීමේදී හා තාවකාලික අනුයුක්ත කිරීම් වලදී කාර්ය මණ්ඩලය ඉක්මවා යාම් සිදු වී ඇත. | .ඉදිරියේදී නියමිත ස්ථාන මාරු පටිපාටි ක්‍රමවේද නිසි ආකාරයෙන් පිලිපැදීම තුලින් වලක්වා ගැනීමට අපේක්ෂා කෙරේ. |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 18 | පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | රා.ප.චක්‍රලේඛ, අංක 05/2008 ට අනුව 2010 වර්ෂයේදී පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සකස්කර ඇති අතර ,අංක 05/2018(1)දරණ සංශෝධිත රාජ්‍ය පරි.චක්‍රලේඛයට අනුව, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සකස්කිරීමේදී එක් එක් අංශවලින් තොරතුරු ලබාගෙන කෙටුම්පතක් සකස් කෙරෙමින් පවති. | නිසි කාල රාමුවකින් යුතුව කටයුතු කිරීම මගින් සිදු වන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත වේ |
| 18.2 | එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | නව ක්‍රමවේදයක් සැකසීමට නියමිතය. | ඉදිරියේදී සිදුවන ප්‍රමාද දෝෂ වලක්වා ගැනීමට කටයුතු කෙරේ. |
| 19 | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කරමින් පවතී | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කඩිනමින් සිදු කිරීමට කටයුතු කෙරේ. |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | එම | එම |
| 19.3 | ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | එම | එම |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කොට තිබීම | අනුකූල නොවේ | එම | එම |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

8. ඇමුණුම I - විගණකාධිපතිවරයාගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඑල්පීපල්/කේඩීඑච්/ඩීඒපීඑච්/2019/59 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2020 ජූනි 05 දින.

ගණන්දීමේ නිලධාරී,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

අභ්‍යන්තර විගණන අංශය
12 JUN 2020
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ගැටඹේ - පේරාදෙණිය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
11 JUN 2020
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය ගැටඹේ - පේරාදෙණිය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත.
වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ අවසාන ශේෂ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ආරම්භක ශේෂ ලෙස ඇතුළත් කිරීමේදී ප්‍රධාන ලෙජර් වියදම් හා 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය අතර රු.1,061,625,704 ක වෙනසක් පැවති අතර එම වෙනස්කම් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 02(අ)(ii) | අක් මුදල් ගැලැපුම් ගිණුමක් පිළියෙල කළයුතු වුවත් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව රු.998,657,372 ක් වන ශේෂයට අක්මුදල් ගැලැපීම් ගිණුමක් සකස් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් රු.6,917,625 ක අක් මුදල් ගැලැපුම් ශේෂය සඳහා ද අක්මුදල් ගැලැපුම් ගිණුමක් ඉදිරිපත් කර නොමැති බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 1.4.9.(iv) | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක බැරකම් සටහන් කළ යුතුය. | 2018 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 1.6.6(ඇ) ඡේදයට ලබාදී ඇති පිළිතුරු අනුව විගණනයෙන් පෙන්වාදීමෙන් පසුව බැරකම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇති බව දක්වා තිබුණද එපරිදි බැරකම් ලේඛනයක් පවත්වාගෙන ගොස් ද නොතිබුණි. |

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

1.6.1.2 පුනරාවර්තන වියදම්

දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන වැය ලෙජරයේ වැය විෂයයන් 03 ක සඳහන් ප්‍රතිපාදන ඉතිරිවීම් හා සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනයේ ඒඩීඑ-2(ii) හි වියදම් ප්‍රකාශයෙහි සඳහන් ඉතිරිවීම් අතර රු.1,309,072 ක වෙනසක් විය.

1.6.1.3 මූලධන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන වැය ලෙජර අනුව වැය විෂයයන් 05 ක ප්‍රතිපාදන ඉතිරිවීම් හා සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනයේ ඒඩීඑ-2(ii) හි වියදම් ප්‍රකාශයෙහි සඳහන් ඉතිරිවීම් අතර රු.1,535,637 ක වෙනසක් විය.

(ආ) වැඩ සටහන් අංක 02 හි රු.759,000,000 ක මූලධන ප්‍රතිපාදනයෙන් රු.698,345,218 ක් වියදම් කර තිබුණද මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයෙහි (ඒසීඒ 2(i)) එක් එක් වැය විෂයයන් යටතේ විස්තර නොදක්වා මුළු වියදම හා මුළු ඉතිරිය පමණක් දක්වා තිබුණි.

1.6.1.4 අත්තිකාරම් ලැබීම්

---------------------

ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි අත්තිකාරම් ලැබීම් වටිනාකම රු.30,271,855 ක් වූ අතර භාණ්ඩාගාර වගුව එස්ඒ-52 අනුව වටිනාකම රු.31,253,172 ක් වූ අතර රු.981,317 ක වෙනස සඳහා හේතු හඳුනාගෙන නොතිබුණි.

1.6.1.5 අක් මුදල් ගැලපුම් ගිණුම

------------------------------

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7 (vi) ඡේදය පරිදි මූල්‍ය කාර්යසාධන වාර්තාව අනුව වර්ෂය අවසානයේ භාණ්ඩාගාරයට පියවිය යුතු හෝ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු වටිනාකම හා මුදල් පොතට අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු අගය අනිවාර්යෙන්ම වෙනස් අගයක් ගන්නා බැවින් එම ශේෂයන් සැසඳීම සඳහා අක් මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කළයුතු වුවත් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව රු.6,917,629 ක් වන ශේෂයට අක්මුදල් ගැලපීම් ගිණුමක් නිවැරදිව සකස් කර නොතිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

-------------------------------------

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි අවසන් ශේෂය රු 2,173,615,162.ක් වුවද 2019 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි ආරම්භක ශේෂය රු. 2,374,193,910 ක් වූ අතර එම ශේෂ අතර රු.200,578,748 ක වෙනසක් විය.

(ආ) මූල්‍ය ප්‍රකාශනයෙහි මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි මිලදී ගැනීම්වල එකතුව රු.6,231,160 ක් වුවද වැය විෂයය 2101, 2102, 2103 හා 2104 අනුව මිලදී ගැනීම් වටිනාකම රු.11,332,548 ක් වූ බැවින් රු.5,101,388 ක වෙනසක් විය.

1.6.2.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක බැරකම් සටහන් කළයුතු අතර රු.15,120,242 ක් වටිනා බැරකම් සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 4 අනුව අයවැය ලේඛනය සකස් කිරීමට පෙර පුනරාවර්තන වියදම් පිළිබඳ ශක්‍යතා අධ්‍යයන ආරම්භ කර කර වියදම් පූර්වානුමාන කළ යුතු අතරම වියදම් අනිසි ලෙස ව්‍යාප්ත වීම අහුරාලනු වස් වියදම් ඉලක්ක නිමවුම සහ පරමාර්ථයන් පැහැදිලිව විස්තර කළ යුතුය. එසේම ප්‍රාග්ධන ව්‍යාපෘති නිසි පරිදි අනුමත කරනු ලැබූ විට සවිස්තරාත්මක ඇස්තමේන්තුවක් පිළියෙල කළ යුතුය. එසේ කටයුතු නොකිරීම මත රු. 1,298,000 ක් වන අයවැය ප්‍රතිපාදනවලට අමතරව රු.176,766,000 ක පරිපූරක ප්‍රතිපාදන සහ රු. 84,933,991 ක දෙපාර්තමේන්තු ආදායම් උපයෝගී කරගෙන වර්ෂය තුළ වියදම් හසුරුවා තිබුණි.

(ආ) පුද්ගල පඩිනඩි, වෙනත් පුනරාවර්තන වැය, මූලධන වැය හා විශේෂ ව්‍යාපෘති වියදම් සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගෙවීම් සඳහා වාර්ෂික අක්මුදල් අවශ්‍යතාවය ඉක්මවා රු. 1,416,656,960 ක අක් මුදල් ඉල්ලීම් කර තිබුණි.

(ඇ) අක් මුදල් අයදුම්පත්‍රයෙහි අක්මුදල් සීමාව ලෙස රු. 1,288,440,000 ක් දක්වා තිබුණද නිවැරදි වටිනාකම රු.1,310,040,000 ක් වූ බැවින් රු. 21,600,000 ක වෙනසක් විය.

2.2 ආදායම් කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් ආදායම් ශීර්ෂ 4 කට අදාළව රැස්කර තිබුණු රු.32,129,157 ක ආදායම් සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව දෙපාර්තමේන්තුව විසින් ආදායම් සංකේත 08 කට අදාළව රු.84,973,991 ක ආදායමක් රැස්කර තිබුණද 2019 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.3 වියදම් කළමනාකරණය

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 07 කට අදාළ රු.109,500,000 ක ශුද්ධ ප්‍රතිපාදනවලින් රු.65,612,613 ක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණු අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 90 ක දක්වා පරාසයක පැවතුණි.

(ආ) වාර්ෂික මුළු වියදමට සාපේක්ෂව පුනරාවර්තන සහ මූලධන වියදම් සඳහා පිළිවෙලින් සියයට 44 ක් හා සියයට 56 ක් බැගින් ප්‍රතිපාදන වෙන් කර තිබුණද සත්‍ය වියදම සළකා බැලීමේදී මුළු වියදමට සාපේක්ෂව පුනරාවර්තන වියදම් වෙනුවෙන් සියයට 99 ක් වැයකර තිබුණු අතර වසර තුළ සිදුකර තිබුණු මූලධන වියදම සියයට 90 ක් වැනි මට්ටමක පැවතුණි.

(ඇ) භාණ්ඩාගාර ලේකම්ගේ 2019 සැප්තැම්බර් 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 5/2019 හා 2019 අප්‍රේල් 08 දිනැති අංක 03/2019 දරන චක්‍රලේඛය අනුව මූලධන වියදම්වලින් සියයට 25 ක් ඉතිරි කළ යුතු වුවද, රු.888,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.94,541,929 ක් හෙවත් සියයට 11 ක් පමණක් ඉතිරි කර තිබුණි.

2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2017 නොවැම්බර් 30 දිනැති අංක 05/2017 දරන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයෙහි 4.vii ඡේදය අනුව හා 2003 සැප්තැම්බර් 06 දිනැති අයවැය චක්‍රලේඛ අංක 162 හි සඳහන් පරිදි 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බිල් ලෙස රු.194,534,780 ක් ගිණුම්ගත කර තිබුණද මූල්‍ය ප්‍රකාශනයෙහි බැරකම් ලෙස රු.15,120,243 ක් දක්වා තිබුණු බැවින් රු.179,414,537 ක වෙනසක් පැවතුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනයේ සටහන් (iii) හි බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් කර තිබූ ශේෂය රු.15,120,243 ක් වුවද විගණනයට ඉදිරිපත් කළ බැරකම් පිළිබඳ සිගාස් වැඩසටහනෙහි මුද්‍රිත පිටපතෙහි එකතුව රු.7,490,782 ක් වීම හේතුවෙන් රු.7,629,461 ක වෙනසක් පැවතුණි.

(ඇ) මුදල් රෙගුලාසි 94(2) හි විධිවිධානවලින් බැහැරව දෙපාර්තමේන්තුව විසින් වැය විෂයයන් 04 කට අදාළව රු.1,485,258 ක ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැදී තිබුණි.

(ඈ) ඉංජිනේරු අංශයට ලැබී තිබුණු නමුත් සහතික නොකළ එකතුව රු.3,669,130 ක් වූ බිල්පත් වටිනාකම බැදීම් ලෙස දක්වා නොතිබුණි.

2.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතියට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, 2019 වර්ෂය සඳහා වූ අවසන් මූල්‍ය ප්‍රකාශන දෙමළ හා ඉංග්‍රීසි භාෂා පිටපත් 2020 මැයි 21 දින එනම් මාස 2 ½ ක ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණු අතර සිංහල මුල් පිටපත පමණක් නියමිත දිනයට භාර දී ඉතිරි පිටපත් 2020 මාර්තු 13 දින එනම් දින 13 ක ප්‍රමාදයකින් පසුව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

(ඇ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, විගණන විමසුම් 07 ක් නිකුත් කර මාස 03 ක කාලයක් ගත වුවද පිළිතුරු සපයා නොතිබුණි.

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| VIII පරිච්ඡේදයේ iv ඡේදය | ආයතන සංග්‍රහයේ නියමයන්ගෙන් බැහැරව වසර ආරම්භයේ සැලැසුම් කළ රු.8,000,000 ක වාර්ෂික අයවැය ප්‍රතිපාදනයට මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන්ගෙන් රු.2,000,000 ක ප්‍රතිපාදන මාරු කර ගෙන රු.9,999,987 ක අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 11 | ගමන් වියදම් සඳහා වූ වැය විෂයයේ රු.7,500,000 ක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති බව දන්වා මුදල් රෙගුලාසි 66 මඟින් රු.2,000,000 ක ප්‍රතිපාදන ලබාගෙන රු.9,497,927 ක ගමන් වියදම් දරා තිබුණද ඒ සඳහා පැහැදිලි හේතු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 101 | නිලධාරීන්ගේ නොසැළකිල්ල මත සිදුවී ඇති හානි හා පාඩු සම්බන්ධයෙන් වූ ලිපිගොනු සොයා ගැනීමට නොහැකි වීම මත පාලින අංශය විසින් වර්ෂ 17 ක් පමණ පැරණි රු.42,200 ක් වූ හානි හා පාඩු සිද්ධි 5 ක් පොත් වලින් කපා හැරීමට නිර්දේශ කර තිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 104(3) හා 104(4) | සංවර්ධන වැඩසටහන්වල තවදුරටත් කපාහැරීමට ඇති සිද්ධීන් සිදුවී මාස 03 සිට වර්ෂ 08 ට වැඩි කාලයක් ගතවී තිබුණද 2008 අගෝස්තු 27 දිනැති අධ්‍යක්ෂ ජනරාල්ගේ දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 2008/01 හි සඳහන් පරිදි හා මුදල් රෙගුලාසි අනුව එකතුව රු.2,807,612 ක් වූ සිද්ධි 16 ක් සම්බන්ධයෙන් නිරවුල් කිරීම් සිදුකර නොතිබුණි. |
| (iv) | | 2011 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරාසයට අයත් රු.1,484,684 ක් වූ සිද්ධි 21 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට අදාළ කමිටු පත් කර තිබුණද තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 272(3) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළ රු.222,679,837 ක් වටිනා වවුචර්පත් 2683 ක් 2020 මැයි 22 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| ( vi ) | මුදල් රෙගුලාසි 396(ඈ) | නිකුත් කර මාස 06 ඉක්මවූ ගෙවීමට ඉදිරිපත් නොකළ රු.62,520 ක් වූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. |
| (vii) | මුදල් රෙගුලාසි 427(අ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් 2015 වර්ෂයේ සිට භාණ්ඩාගාරයේ හා දෙපාර්තමේන්තු ගිණුම් අතර පැවත එන රු.100,125 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (viii) | මුදල් රෙගුලාසි 570(ඈ) සහ 571(3) | වර්ෂ 02 ක් ඉක්ම වූ රු.2,302,808 ක් ඉකුත් තැන්පතු 97 ක්රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන අධ්‍යක්ෂ ජනරාල්ගේ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ | |
| | (i) ඡේද අංක 3.1 අනුව | සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට අදාළ භාණ්ඩාගාර මුද්‍රිතයන් මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම් ලෙස ඇතුළත් කර නොතිබුණි. |
| | (ii) ඡේද අංක 06 | තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට ඇති මෙහෙයුම් වැඩසටහනෙහි සිද්ධි 07 ක් හා සංවර්ධන වැඩසටහනේ සිද්ධි 23 ක් මුදල් රෙගුලාසි 109 යටතේ වන පොතෙන් කපාහැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා තිබුණි. |
| | (iii) | සංවර්ධන වැඩසටහනෙහි සිද්ධි 32 කට අදාළ රු.1,936,263 ක පාඩු හා අත්හැරීම් පිළිබඳ තොරතුරු පොත්වලින් කපා හැරීම් පිළිබඳ ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ | |
| | භාණ්ඩාගාර ලේකම්ගේ 2019 ජූනි 17 දිනැති අංක 04/2019 දරන අයවැය චක්‍රලේඛයේ 02 (iv) | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා වැය විෂය යටතේ වන වියදම් හැකිතාක් දුරට අවම කරගත යුතු බව දක්වා තිබුණද ඒ අනුව කටයුතු නොකර වාර්ෂික ප්‍රතිපාදනවලට අමතරව සහ සමාලෝචිත වර්ෂය තුළ පරිපූරක ඇස්තමේන්තු මඟින් රු. 1,000,000 ක් හා මුදල් රෙගුලාසි 66 මාරු කිරීම මඟින් රු.500,000 ක් මාරු කර එකතුව රු.5,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.4,617,087 ක් වියදම් කර තිබුණි. |

(ඉ) දෙපාර්තමේන්තු චක්‍රලේඛ

| | |
|---|---|
| 2008 අගෝස්තු 27 දිනැති අධ්‍යක්ෂ ජනරාල්ගේ දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 2008/01 | සතුන් මිය යාම සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග දක්වා තිබුණද, එම හේතුන් නිවැරදි කිරීමට කටයුතු නොකිරීම මත 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සතුන් මියයාම් සම්බන්ධයෙන් වූ රු.8,536,078 ක හානි හා පාඩු පොත්වලින් කපා හැර තිබුණි. |

## 2.7 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අත්තිකාරම් මුදල නිශ්චිත කාර්යයක් සඳහා යොදවා ගත යුතු වුවද අවස්ථා 05 කදී ලබාගත් රු.122,250 ක සම්පූර්ණ අත්තිකාරම් මුදල එසේ උපයෝජනය නොකර දින 08 ත් දින 21 ත් අතර කාලයක් නිෂ්ක්‍රියව අත රදවා ගෙන නැවත පියවා තිබුණි.

(ආ) නිශ්චිත ඇස්තමේන්තුවක් සකස් කර අත්තිකාරම් මුදල් ලබා නොගැනීම හේතුවෙන් අවස්ථා 29 කදී ලබාදුන් රු.916,038 ක අත්තිකාරම් මුදල්වලින් රු.250,211 ක් වැය නොකර මුදලින් පියවා තිබුණි.

(ඇ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛය මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව අවස්ථා 23 කදී රු.5,845,296 ක අත්තිකාරම් ලබාදී තිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 371(ඇ) ප්‍රකාරව දෙන ලද අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවද අවස්ථා 11 කදී ලබාදුන් අත්තිකාරම් දින 05 සිට දින 27 දක්වා අත රඳවාගෙන පියවා තිබුණි.

(ඉ) 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් වසරක සිට වසර 05 ක් දක්වා කාල පරාසයක සිට අයවිය යුතු රු.135,369 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/ 2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව 2018 වර්ෂයෙන් ඉදිරියට විශ්‍රාම හෝ මරණ පාරිතෝෂික ලබාදී ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ණය ශේෂයක් අත්තිකාරම් බී ගිණුමේ නොපැවතිය යුතු වුවද, නිලධාරීන් සිවු දෙනෙකුගෙන් රු.599,316 ක ණය ශේෂයන් අයවිය යුතුව පැවතුණි.

(උ) ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2019 ජූනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ රු.433,377 ක ණය ශේෂ මාස 03 ක් තුළ පියවීමට කටයුතු කර නොතිබුණි.

2.8 තැන්පතු

---------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 හා 2017 වර්ෂවලදී කොන්ත්‍රාත් වෙනුවෙන් රඳවාගත් රු.185,593 ක් වටිනා රඳවුම් මුදල් ශේෂ 11 ක් ආදායමට ගෙන තිබුණු අතර කොන්ත්‍රාත්වල අඩුපාඩු නිවැරදි කිරීමට හෝ පසු විපරම් කටයුතු සිදු කර ගෙවීමට හෝ කටයුතු නොකර වර්ෂ 02 ඉක්ම වූ පසු ආදායමට ගෙන තිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2015 ජූනි 24 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 243/2015 හි 02 ඡේදය ප්‍රකාරව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) වගන්තිය ප්‍රකාරව නියමිත කාර්යය සඳහා නීතියෙන් වෙන් නොකරන සියලු ලැබීම් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද AFFACI ව්‍යාපෘතියට අදාළව 2016 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා රු.3,698,111 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන එම ගිණුමෙන් රු.1,812,666 ක් ගෙවීම් කර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1,885,445 ක් විය.

(ඇ) 2019 මාර්තු 15 දිනැති අංක සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑෆ්පීඑච්/2018/74 දරන විගණන විමසුම මගින් පෙන්වා දී තිබුණද ඉදිකිරීම් කටයුතු වලට අදාළ රු.123,152 ක් වටිනා මුදලක් ටෙන්ඩර් තැන්පතු ගිණුමේ සඳහන් නොකර අනුචිත ලෙස තාවකාලික රැඳවුම් ගිණුමට බැර කර තිබුණි.

(ඈ) උතුරු මැද පළාත් අධ්‍යක්ෂ විසින් කිරි නිෂ්පාදන ගොවිපළ හඳුනා ගැනීමේ ව්‍යාපෘතිය යටතේ ගවයින්ගේ රුධිර පරීක්ෂා කිරීමේ උපකරණ මිලදී ගැනීම සඳහා 2019 සැප්තැම්බර් 06 දින රු.618,100 ක චෙක්පතක් එවා තිබුණද වර්ෂය අවසන් වන තෙක්ම එම කාර්යය ඉටු කිරීමට කටයුතු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඉ) 2015 ජූනි 24 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 243/2015 5.1(ඇ) අනුව පොදු තැන්පත් ගිණුමට 2018 ඔක්තෝබර් 22 දින සිට 2019 ඔක්තෝබර් 04 දින දක්වා ව්‍යාපෘති සඳහා ලැබී තිබූ රු.428,500 ක මුදලක් අදාළ කාර්යයන් සඳහා යොදවා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඊ) ඉහත චක්‍රලේඛ 5.1(ආ) ඡේදය පරිදි අඛණ්ඩව රැස්කරනු ලබන එහෙත් නිශ්චිත ආදායම් සංකේතාංක හඳුන්වා දී නැති ලැබීම් සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව දැනුවත් කොට තම ආදායම් සංකේත ලබාගත යුතු වුවද වසර ගණනාවක සිට ජාතික විද්‍යා පදනම මගින් පශු පර්යේෂණායතනයේ පර්යේෂණ සම්බන්ධයෙන් බැර කරනු ලැබූ රු. 2,671,334 ක තැන්පතු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන වියදම් කර තිබුණි. මේ අනුව බැර කරන ලද රු.2,671,333 ක මුදලින් 2019 දෙසැම්බර් 31 දිනට රු.1,181,290 ක ඉතිරියක් පැවතුණි.

(උ) වෙනත් ආයතනවලට ප්‍රේෂණය කිරීම සඳහා නිලධාරීන්ගේ වැටුප්වලින් අවකරණය කරගනු ලැබූ රු. 46,448 ක ශේෂයන් නිරවුල් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

---------------------------------------------------

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

වයි.එම්.චන්ද්‍රසේකර බණ්ඩා

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

වයි. එම්. චන්ද්‍රසේකර බණ්ඩා
සහකාර විගණකාධිපති